# වරින් වර සිරුරේ ඇතිවන පලු දැමීම (Urticaria)

## (1) Urticaria යනු කුමක්ද?

- වරින්වර තදින් කසන සුළු පලු (සිරුර පුරා) ඇති වීමේ රෝගී තත්ත්වයකි.
- මෙය සුලබ රෝගී තත්ත්වයක් වන අතර සෑම පස්දෙනෙකුගෙන් එක් අයෙකුට තම ජීවිත කාලය තුළ Urticaria රෝගය වැළඳීමේ අවදානමක් ඇත.
- මෙය බෝවන රෝගයක් නොවන අතර වැඩිහිටියන් මෙන්ම දරුවන්ට ද වැළඳිය හැකිය.

## (2) Urticaria රෝගය සෑදෙන්නේ කෙසේද?

- මෙය ඇතිවන්නේ සමේ ඇති **සෛල** වර්ගයක් මගින් හිස්ටැමින් (Histamine) නැමැති සංයෝගය නිදහස් කිරීම නිසාය.
- බොහෝ විට මේ සඳහා නිශ්චිත හේතුවක් නොමැති අතර රුධිර පරීක්ෂණ ද අසාමාන්‍යතාවක් පෙන්නුම් නොකරයි.
- සමහර අවස්ථාවල මෙම තත්ත්වය ඖෂධ, ආහාර වර්ග, එන්නත්, ආසාදන, ව්‍යායාම, දහදිය දැමීම, හිරු එළිය, අධික සීතල හා තෙරපුම වැනි හේතු නිසා මතුවිය හැක.

## (3) මෙහි රෝග ලක්ෂණ මොනවාද?

- ශරීරය පුරා මදුරුවන් විද්දාක් මෙන් හෝ ඊට විශාල පලු ඇතිවෙන අතර ඉතා තදින් කැසීමක් ද ඇති වෙයි.
- පලු සුළු වෙලාවකින් (පැය 24 කට වඩා පවතින්නේ නැත) බැස යන අතර පලු තිබූ තැන්වල සමේ කිසිදු සලකුණක් ඉතිරි නොවේ.
- මෙම පලු වරින් වර මතු වන අතර සති කීපයක සිට මාස ගණනක් හෝ කලාතුරකින් අවුරුදු කීපයක් වුවත් වරින් වර ඇති විය හැකිය.
- සමහර විට පලුත් සමග ඇස්, තොල් සහ අත් පා ඉදිමිය හැක.
- ක්ලාන්තය, හුස්ම ගැනීමේ අපහසුතාව, ගිලීමේ අපහසුතාවය හෝ කටහඬ වෙනස්වීමක් කලාතුරකින් ඇතිවිය හැක.

## (4) රෝගය නිර්ණය කරන්නේ කෙසේද?

- පළපුරුදු වෛද්‍යවරයකුට රෝග ඉතිහාසය හා රෝග ලක්ෂණ මගින් පහසුවෙන් රෝගය නිර්ණය කළ හැකිය.
- විශේෂ රුධිර පරීක්ෂණ අවශ්‍ය වන්නේ ඉතා කලාතුරකිනි.

**(5)** මේ සඳහා ඇති ප්‍රතිකාර මොනවා ද?

- Urticaria රෝගීන් වේදනානාශක (ඇස්ප්‍රීන් මෝ(ර්)ෆීන් වැනි) පාවිච්චියේදී සැලකිලිමත් විය යුතුය.
- මෙම තත්ත්වය වැඩිවීමට හේතු වන සාධකයක් හඳුනාගත හැකි නම් (උදා: සමහර ආහාර වර්ග) එයින් වැළකිය යුතුයි.
- රෝග ලක්ෂණ පාලනය සඳහා සාර්ථක ඖෂධීය (Antihistamine tablets) ප්‍රතිකාර ඇත.
- සමහර විට රෝගය සුව වීමට දීර්ඝ කාලයක් (මාස කීපයක් හෝ අවුරුදු කීපයක්) මෙම ප්‍රතිකාර ලබාගත යුතු වෙයි.
- වැදගත් කරුණක් වන්නේ පලු ඇති වුවත් නැතත් වෛද්‍යවරයා උපදෙස් දෙන තෙක් ඖෂධීය ප්‍රතිකාර නතර නොකිරීමයි.
- හිරු එළිය, ජලය, දහදිය වැනි හේතු වලින් පලු දැමීම වැඩි වන්නේ නම් එම තත්ත්වයන් පාලනයට කටයුතු කළ යුතුය.

**(6)** මෙම රෝගය භයානක තත්ත්වයක් ද?

- සාමාන්‍යයෙන් මෙය භයානක තත්ත්වයක් නොවේ.
- නමුත් මෙම රෝගය ඇති සමහරෙකුට තොල් ඉදිමීම, පපුවේ හිර ගතිය, හුස්ම ගැනීමේ අපහසුතාවය, ක්ලාන්තය වැනි රෝග ලක්ෂණ (Angioedema) ඇතිවිය හැක.
- මෙම රෝග ලක්ෂණ ඇති නම් හැකි ඉක්මනින් ළඟම ඇති රෝහලට ඇතුළු වීම වැදගත් වේ.